# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන)

**2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි.**

---

ස්වදේශ කටයුතු අමාත්‍යතුමා විසින් 2016 ජූලි මස 05 වැනි දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2016 ජූනි මස 10 වැනි දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[121 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 16.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 15.00 යි.**

## නීතිය බලපෑමේ ප්‍රකාශය

**2 වන වගන්තිය :** මේ වගන්තිය මගින් (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනතේ දීර්ඝ නාමය සංශෝධනය කරනු ලබන අතර, එය එකී ප්‍රඥප්තියේ 1අ අලුත් කොටසේ ඇතුළත් කිරීම්වලට ආනුෂංගික වේ.

**3 වන වගන්තිය :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ පූර්විකාව සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ පූර්විකාවේ නීතිය බලපෑම වනුයේ 1අ කොටසේ අරමුණුවලට අනුගාමීව ප්‍රධාන ප්‍රඥප්තියේ යෙදවීමේ විෂය පථය නිශ්චිතව සඳහන් කිරීම වේ.

**4 වන වගන්තිය :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ සාමාන්‍ය සංශෝධනයක් සිදු කරනු ලබන අතර, ඒ සංශෝධනයේ නීතිය බලපෑම වන්නේ එකී ප්‍රඥප්තියෙන් අපේක්ෂා කරන අරමුණු වඩාත් නිවැරදිව නිශ්චය කිරීමට විශේෂ විධිවිධානයක් ලෙස ප්‍රධාන ප්‍රඥප්තිය නම් කිරීම වේ.

**5 වන වගන්තිය :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වන්නේ ප්‍රධාන ප්‍රඥප්තියේ කොටස්වල ක්‍රියාත්මක වීමේ කාලසීමා දීර්ඝ කිරීම සම්බන්ධව වෙනස් දින නිශ්චිතව දැක්වීම වේ.

**6 වන වගන්තිය :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය උපලේඛනයට සිදුකරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

**7 වන වගන්තිය :** මේ වගන්තිය මගින් 3 වන උපවගන්තිය එකතු කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, ඒ සංශෝධනයේ නීතිය බලපෑම වන්නේ දක්නට නොමැති බවට වූ සහතිකයක් අවලංගු කිරීමට පෙරාතුව අතුරුදහන් වූ තැනැත්තකු සම්බන්ධයෙන් මරණ සහතිකයක් නිකුත් කිරීම තහනම් කිරීම වේ.

**8 වන වගන්තිය :** මේ වගන්තිය මගින් 7අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, ඇතුළත් කරන ලද පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වන්නේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ තීරණයෙන් අතෘප්තියට පත් ඉල්ලුම්කරුවකු සම්බන්ධයෙන් දිසා අධිකරණයෙන් සහනයක් ලබා ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

**9 වන වගන්තිය :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය උපලේඛනයට සිදු කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

**10 වන වගන්තිය :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 1අ අලුත් වගන්තියක් ඇතුළත් කරනු ලබන අතර, ඒ අලුත් කොටස මගින් උතුරු සහ නැගෙනහිර පළාත්වල ගැටුම්, දේශපාලන නොසන්සුන්තාවය හෝ සිවිල් කැරලි කෝලාහල හෝ බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම හේතුවෙන් අතුරුදහන් වූ තැනැත්තන් ලියාපදිංචි කිරීම සහ අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන් වෙත නොමැති බවට වූ සහතිකයක් නිකුත් කිරීම සඳහා විධිවිධාන සැලසීම වේ.

**11 වන වගන්තිය :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය උපලේඛනයට සිදුකරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

**12 වන වගන්තිය :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, එය 1 වන සහ 1අ කොටස් ක්‍රියාත්මක වීමේ දී ආනුෂංගික වේ.

**13 වන වගන්තිය :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වන්නේ වැරදි සහ දණ්ඩනවලට අදාළ වන විධිවිධාන දීර්ඝ කිරීම වේ.

**14 වන වගන්තිය :** මේ වගන්තිය මගින් "අමාත්‍යවරයා" සහ "ඥාතීන්" යන වචන වෙනුවට අලුත් අර්ථකථනයක් ඇතුළත් කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

**15 වන වගන්තිය :** මේ වගන්තිය මගින් "ආ" සහ "ඇ" අලුත් ආකෘති ඇතුළත් කිරීම මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කරනු ලැබේ. "ආ" ආකෘතියෙන් අතුරුදහන් වූ තැනැත්තකු ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍රයේ ආකෘතිය සහ නොමැති බවට වූ සහතිකයක් නිකුත් කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයේ ආකෘති නිශ්චය කර ඇත. "ඇ" ආකෘතියෙන් නොමැති බවට වූ සහතිකයේ ආකෘතිය නිශ්චිතව දැක්වේ.

## මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන)

එල්.ඩී.ඕ.— 41/2015

**2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2016 අංක දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2010 අංක 19 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනතේ දීර්ඝ නාමය එහි "ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා" යන වචන වෙනුවට "උතුරු හා නැගෙනහිර පළාත්වල සිදු වූ ගැටුම් හෝ එම ගැටුම්වලට පසුව හෝ දේශපාලන නොසන්සුන්තාව හෝ සිවිල් කැරලි කෝලාහල හෝ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වල ප්‍රතිඵලයක් වශයෙන් අතුරුදහන් වී ඇති බවට වාර්තා කර ඇති තැනැත්තන් හෝ ක්‍රියාන්විතයේ දී අතුරුදහන් වූ ලෙස හඳුනාගෙන ඇති සන්නද්ධ හමුදාවල හෝ පොලීසියේ සාමාජිකයන් ලියාපදිංචි කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ පූර්විකාව සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ පූර්විකාව පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ :-

(1) "රාජ්‍ය විරෝධී ක්‍රියාකාරකම් හෝ ජන කැළඹීම්" යන වචන වෙනුවට, "රාජ්‍ය විරෝධී ක්‍රියාකාරකම්, හෝ උතුරු හා නැගෙනහිර පළාත්වල ගැටුම් හෝ එම ගැටුම්වලට පසුව හෝ දේශපාලන නොසන්සුන්තා හෝ සිවිල් කැරලි කෝලාහල හෝ බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම්" යන වචන ආදේශ කිරීමෙන්,

(2) "එවැනි මරණ ලියාපදිංචි කිරීමට" යන වචන වෙනුවට " එවැනි මරණ සහ එසේ අතුරුදහන් වී ඇති තැනැත්තන් ලියාපදිංචි කිරීමට" යන වචන ආදේශ කිරීමෙන්.

2—PL 009996 -425 (2016/06)

ප්‍රධාන ප්‍රඥප්තියට කරනු ලබන සාමාන්‍ය සංශෝධන.

**4.** (1) ප්‍රධාන ප්‍රඥප්තියේ සහ වෙනත් යම් ලිඛිත නීතියක "මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත "යන වචන යොදා ඇති කවර හෝ අවස්ථාවක දී ඒ වෙනුවට "මරණ සහ අතුරුදහන් වී ඇති තැනැත්තන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත" යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය.

(2) යම් දැන්වීමක, නිවේදනයක, ගිවිසුමක, සන්නිවේදනයක හෝ වෙනත් ලේඛනයක "මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත"ට කර ඇති සෑම සඳහනක් ම පිළිවෙළින් "මරණ සහ අතුරුදහන් වී ඇති තැනැත්තන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත" ට කරන ලද සඳහනක් ලෙස කියවා තේරුම්ගත යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන වගන්තිය එම වගන්තියේ (2) සහ (3) උපවගන්ති වෙනුවෙන් පහත දැක්වෙන වගන්ති ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(2) මේ පනතේ ක්‍රියාත්මක වීමට නියමිත කාල සීමාවේ යම් දීර්ඝ කිරීමක් පැවතිය ද, අමාත්‍යවරයා විසින් මේ පනතේ I වන සහ Iඅ වන කොටස් ක්‍රියාත්මකව පැවතීමට නියමිත යම් කාල සීමාවක් ඉකුත් වීමට එක් මසකට නොඅඩු කාලයකට පෙරාතුව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, එවැනි කාලසීමාව දීර්ඝ කරනු ලැබිය හැකි යː

එසේ වුව ද,-

(අ) එවැනි යම් ක්‍රියාත්මකව පවතින කාලසීමාවක් දීර්ඝ කිරීම අමාත්‍යවරයා විසින් සහන අපේක්ෂා කරනු ලබන ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව සැලකිල්ලට ගෙන එම කාලසීමාව පිළිබඳව සමාලෝචනයක් කිරීමෙන් අනතුරුව කරනු ලැබිය හැකි ය; සහ

(ආ) කිසිදු එක් අවස්ථාවක දී එවැනි යම් දීර්ඝ කිරීමක්, අවුරුදු දෙකක කාලසීමාවකට වඩා වැඩි නොවිය යුතු ය.

(3) මේ පනතේ I සහ Iඅ කොටස් ක්‍රියාත්මකවීම අවසන්වීම නොතකා, II වන සහ III වන යන කොටස්වල විධිවිධාන දිගටම ක්‍රියාත්මකව පැවතිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 2වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය එහි (2) වන උපවගන්තියේ "උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ආකෘතියට සාරානුකූල විය යුතු" යන වචන වෙනුවට "උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන අ ආකෘතියට සාරානුකූල විය යුතු" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය එහි (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන නව උපවගන්තිය එකතු කිරීම මඟින් සංශෝධනය කරනු ලැබේ:-

"(5) අතුරුදහන් වූ තැනැත්තකු සම්බන්ධයෙන් 8ඉ වගන්තිය යටතේ දක්නට නොමැති බවට වූ සහතිකයක් නිකුත් කරනු ලැබ ඇති විට, දක්නට නොමැති බවට වූ සහතිකය අවලංගු කරනු ලබන තෙක් එම අතුරුදහන් වූ තැනැත්තා සම්බන්ධයෙන් මරණ සහතිකයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 7අ වගන්තිය ඇතුළත් කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එම වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු යː-

"අතෘප්තියට පත් වූ විට දිසා අධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය.

7අ. 7 වන වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ තීරණයෙන් අතෘප්තියට පත් ඉල්ලුම්කරුවකු අවස්ථාවෝචිත පරිදි, එම ප්‍රතික්ෂේප කිරීමේ හෝ නිකුත් කිරීමේ නිවේදනයේ සිට එක් මාසයක් ඇතුළත එම ප්‍රතික්ෂේප කිරීම හෝ නිකුත් කිරීමට එරෙහිව දිසා අධිකරණයට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. ඉදිරිපත් කර ඇති කරුණු සමාලෝචනය කිරීමෙන් පසු, දිසා අධිකරණය මඟින් අවස්ථාවෝචිත පරිදි රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ තීරණය ස්ථිර කිරීම හෝ දක්නට නොමැති බවට වූ සහතිකයක් නිකුත් කිරීමට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට විධාන කිරීම හෝ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද වාර්තාව ප්‍රතික්ෂේප කිරීම කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය එහි (1) වන උපවගන්තියේ "උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයට සාරානුකූලව," යන වචන වෙනුව"උපලේඛනයේ දක්වා ඇති අ ආකෘති පත්‍රයට

සාරානුකූලව," යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් Iඅ කොටස ඇතුළත් කිරීම.

**10.** I වන කොටසට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් කොටස (8අ සිට 8ඔ දක්වා වූ වගන්ති) මෙයින් ඇතුළත් කරනු ලබන අතර එම කොටස ප්‍රධාන ප්‍රඥප්තියේ Iඅ කොටස වශයෙන් බලාත්මක විය යුතු යඃ-

"Iඅ කොටස

**උතුරු හා නැගෙනහිර පළාත්වල ගැටුම්, දේශපාලනික නොසන්සුන්තා හෝ සිවිල් කැරලි කෝලහල හෝ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වල ප්‍රතිඵලයක් වශයෙන් අතුරුදහන් වී ඇති තැනැත්තන් ලියාපදිංචි කිරීම.**

දක්නට නොමැති බවට වූ සහතිකයක් ලබා ගැනීමට ඉල්ලුම් කිරීමට අවශ්‍ය කාර්ය පටිපාටිය.

8අ. (1) යම් තැනැත්තකු අතුරුදහන් වී ඇති බවට වාර්තා වන සහ ඔහු ජීවත්ව සිටියේ නම් ඔහු ගැන ස්වභාවිකව අසන්නට ලැබෙන්නේ යම් තැනැත්තන්ට ද ඒ තැනැත්තන්ට එක් අවුරුද්දක් ඉක්මවන කාලයක් තුළ දී ඔහු ගැන අසන්නට ලැබී නොමැති සහ ඔහුගේ අතුරුදහන් වීම උතුරු හා නැගෙනහිර පළාත්වල සිදු වූ ගැටුම්වලට හෝ එම ගැටුම්වලට පසුව හෝ දේශපාලන නොසන්සුන්තා හෝ සිවිල් කැරලි කෝලහල හෝ අතුරුදහන් කිරීම්වලට ආරෝපණය කරනු ලැබිය හැකි අවස්ථාවක හෝ ක්‍රියාන්විතයේ දී අතුරුදහන් වූ ලෙස හඳුනාගෙන ඇති සන්නද්ධ හමුදාවල සාමාජිකයකු හෝ පොලිසියේ සාමාජිකයකු (මෙහි මින් මතු "අතුරුදහන් වූ තැනැත්තා" යනුවෙන් හඳුන්වනු ලබන) එම තැනැත්තාගේ ඥාතියකු විසින් එම තැනැත්තා අතුරුදහන් වූ තැනැත්තකු ලෙස ලියාපදිංචි කරන ලෙසත් ඔහු සම්බන්ධයෙන් තමාට දක්නට නොමැති බවට වූ සහතිකයක් නිකුත් කරන ලෙසත් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ වූ ඒ සෑම ඉල්ලීමක් ම මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ආ ආකෘතියට සාරානුකූල විය යුතු අතර රෙජිස්ට්‍රාර්

ජනරාල්වරයා වෙත හෝ අතුරුදහන් වූ තැනැත්තා අවසන්වරට පදිංචිව සිටි හෝ ඔහුගේ ස්ථිර වාසස්ථානය පිහිටි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙත හෝ ඉදිරිපත් කළ යුතු ය.

(3) (මෙහි මින් මතු "ඥාතියා" වශයෙන් හඳුන්වනු ලබන) උපලේඛනයේ ආ ආකෘතිය යටතේ පත් කරන ලද ඥාතියා විසින් මේ පනතේ විධිවිධානවලට අනුකූලව අතුරුදහන් වූ තැනැත්තාගේ සහ එම අතුරුදහන් වූ තැනැත්තාගේ දේපළවල උරුමකරුවන්ගේ පරම යහපත සැලකිල්ලට ගෙන එම අතුරුදහන් වූ තැනැත්තාගේ කටයුතු කළමනාකරණය කළ යුතු ය.

අතිරේක කරුණු සැපයිය යුතු බව.

8ආ. සෑම ඉල්ලීමක් ම, අතුරුදහන් වී ඇති බවට ලියාපදිංචි කිරීමට අපේක්ෂා කරන්නේ යම් තැනැත්තකුගේ ද, ඒ තැනැත්තා අතුරුදහන් වී ඇති බවට තමාට විශ්වාස කිරීමට ඇති හේතු සඳහන් කරනු ලබන ඉල්ලුම්කරුගේ දිව්රුම් ප්‍රකාශයක් මඟින් එකී ඉල්ලුම්කරු විසින් තහවුරු කරනු ලැබිය යුතු ය. අතුරුදහන් වී ඇති බවට ලියාපදිංචි කිරීමට අපේක්ෂා කරනු ලබන්නේ යම් තැනැත්තකුගේ ද, ඒ තැනැත්තා අවුරුදු එකකට වැඩි කාලයක් තමා දැක නැති බව හෝ ඔහු ගැන අසා නැති බව ස්ථිර කරමින් ඒ තැනැත්තා අවසන් වරට පදිංචිව සිටි හෝ ඔහුගේ ස්ථිර වාසස්ථානය පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීගෙන් ලබා ගත් වාර්තාවක් සහ ඒ ඉල්ලීම තහවුරු කරන වෙනත් යම් සාක්ෂි ද සමඟ ඒ ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

ඉල්ලුම් පත්‍රය ප්‍රදර්ශනය කර තැබීම.

8ඇ. මෙම කොටස යටතේ ඉල්ලීමක් ලැබුණු විට, අවස්ථාවෝචිත පරිදි, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ඉල්ලීමේ පිටපතක් තමාගේ කාර්යාලයේ දැන්වීම් පුවරුවේ ද, අදාළ ග්‍රාම නිලධාරියාගේ කාර්යාලයේ ද, සති දෙකක කාලයක් ප්‍රදර්ශනය කර තැබීමට සැලැස්විය යුතු ය.

ලියාපදිංචි කිරීමට විරෝධය දැක්වීම.

8ඈ. ඉල්ලීමක පිටපතක් 8ඇ වගන්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට ප්‍රදර්ශනය කරන ලද දිනයේ සිට එක් මාසයක් ඇතුළත දී එම ඉල්ලීම අදාළ වන තැනැත්තා අතුරුදහන් වී ඇති බවට ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් හෝ ඥාතියා පත් කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකුට ඇති විරෝධතා ඒ තැනැත්තා විසින්, අවස්ථාවෝචිත පරිදි, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලිඛිතව ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, එසේ විරෝධතා පෑමට හේතු පැහැදිලිව දක්වමින් ඒ විරෝධය පාන්නා විසින් සහ වෙනත් යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරනු ලබන දිවුරුම් ප්‍රකාශයක් මඟින් ඒ විරෝධතා තහවුරු කරනු ලැබිය යුතු අතර එම විරෝධතාවලට සහාය වීමට සාක්ෂි ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

අතුරුදහන් වූ තැනැත්තන් ලියාපදිංචි කිරීම.

8ඉ. (1) ඉල්ලීමකට විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා ඉඩ දී ඇති එක් මාසයක කාලසීමාව ඉකුත් වූ පසු, ඒ ඉල්ලීම සහ යම් විරෝධතාවයක් ඇත්නම් ඒ විරෝධතා ද තහවුරු කිරීමට ඇති සාක්ෂි ද සමඟ, අවස්ථාවෝචිත පරිදි, ඒ ඉල්ලීම රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් සලකා බැලිය යුතු ය. රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීම හෝ යම් සාක්ෂි කැඳවීම සහ ඔහු විසින් අවශ්‍ය යැයි සලකනු ලබන යම් පරීක්ෂණයකින් පසු ඉල්ලීමේ සඳහන් කරුණුවල සත්‍යතාව පිළිබඳ තමා සෑහීමට පත් වන්නේ නම්, ඒ ඉල්ලීමට ඉඩ දිය යුතු ය.

(2) ඉල්ලීම රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත කර ඇති අවස්ථාවක දී, හේතු දක්වා දක්නට නොමැති සහතිකයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කර ඇත්නම් මිස, එම පරීක්ෂණය අවසානයේ අතුරුදහන් වූ තැනැත්තන්ගේ ලේඛනයේ ලියාපදිංචි කරන ලෙස සහ 8උෟ වගන්තිය යටතේ ඔහුගේ අත්සනින් ඥාතියා වෙත දක්නට නොමැති බවට වූ සහතිකයක් නිකුත් කරන ලෙස, දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට විධාන කරමින් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් නියමයක් කළ යුතු ය.

(3) ඉල්ලීම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙත කර ඇති අවස්ථාවක දී, එම පරීක්ෂණය අවසන්

කිරීමෙන් පසුව අතුරුදහන් වූ තැනැත්තා පිළිබඳ විස්තර සඳහන් කරමින් තමාගේ අත්සන යටතේ වූ වාර්තාවක් ඒ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත යැවිය යුතු ය. හේතු දක්වා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් දක්නට නොමැති සහතිකයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කර ඇත්නම් මිස, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් වාර්තාවේ කරුණු සලකා බැලීමෙන් පසු 8උෟ වගන්තිය යටතේ ඇති අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ ලේඛනයේ අතුරුදහන් වූ තැනැත්තා ලියාපදිංචි කරන ලෙස සහ ඥාතියා වෙත ඔහුගේ අත්සනින් දක්නට නොමැති බවට වූ සහතිකයක් නිකුත් කරන ලෙස දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට විධාන කරමින් නියමයක් කළ යුතු ය.

(4) දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ අනුව යම් විස්තර අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ ලේඛනයේ ඇතුළත් කරමින් 8අ වගන්තිය යටතේ ඉල්ලීමක් කරන ලද ඥාතියා වෙත උපලේඛනයේ ඇ ආකෘතියට සාරානුකූලව දක්නට නොමැති බවට වූ සහතිකයක් නිකුත් කළ යුතු ය.

(5) දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් නොපමාව අදාළ ලියාපදිංචි සටහනේ අනුපිටපතක් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත යැවීමට ඉදිරිපත් කළ යුතු ය. 8ඊ වගන්තිය යටතේ දිසා අධිකරණයේ සමාලෝචනයට යටත්ව 8උෟ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පවත්වා ගෙන යනු ලබන ලේඛනයේ අවශ්‍ය සටහන් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් නොපමාව ඇතුළත් කළ යුතු ය. මේ පනතේ අරමුණු උදෙසා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් කරන ලද ලියාපදිංචි සටහන් අවසානාත්මක විය යුතු ය.

අතෘප්තියට පත් වී ඇත්නම් දිසා අධිකරණයට ඉල්ලුම් කිරීම.

8ඊ. 8ඉ වගන්තිය යටතේ, තමාට දක්නට නොමැති බවට වූ සහතිකයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරමින් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් කරන ලද තීරණයකින් අතෘප්තියට පත් ඉල්ලුම්කරුවකු හෝ 8ඈ වගන්තිය යටතේ මෙම කොටස යටතේ දක්නට නොමැති බවට වූ සහතිකයක් නිකුත් කිරීමට විරෝධය පළ කළ යම් තැනැත්තකු එම ප්‍රතික්ෂේප කිරීම හෝ සහතිකය නිකුත් කිරීම පිළිබඳව වූ දැන්වීමේ දින සිට මාසයක්

ඇතුළත දී අවස්ථාවෝචිත පරිදි, එකී ප්‍රතික්ෂේප කිරීම හෝ නිකුත් කිරීමට විරුද්ධව දිසා අධිකරණයට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ හැකි ය. දිසා අධිකරණය විසින් තමා ඉදිරියේ ඇති කරුණු සමාලෝචනය කිරීමෙන් පසු රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ තීරණය ස්ථිර කිරීම හෝ පසෙක තැබීම සහ අවස්ථාවෝචිත පරිදි රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට දක්නට නොමැති බවට වූ සහතිකයක් නිකුත් කරන ලෙස අණ කිරීම හෝ ඥාතියකුගේ ඉල්ලුම් පත්‍රයට අවසර දීම හෝ සිදු කරනු ලැබිය හැකි ය.

පරීක්ෂණ කොමිෂන් සභාවක් හෝ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් හෝ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් අනාවරණය කරගනු ලැබූ තොරතුරු අදාළ වන තැනැත්තන් ගේ අතුරුදහන් වීම, ලියාපදිංචි කිරීමට අදාළ විශේෂ කාර්ය පටිපාටිය.

8උ. (1) (393 වන අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරනු ලබන කොමිෂන් සභාවක් විසින් හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් විසින්, හෝ 2016 අංක  දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත යටතේ යම් තැනැත්තකු අතුරුදහන් කර වූ බවට හෝ අතුරුදහන් වී ඇති බවට තොරතුරු අනාවරණය කරගනු ලැබූ අවස්ථාවක දී, මේ පනතේ උපලේඛනයේ "ආ" ආකෘතියට සාරානුකූලව එම අතුරුදහන් වී ඇති තැනැත්තා සම්බන්ධව දක්නට නොමැති බවට වූ සහතිකයක් තමා වෙත නිකුත් කරන ලෙස එම අතුරුදහන් වූ තැනැත්තාගේ ඥාතියා විසින් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා හෝ එම අතුරුදහන් වූ තැනැත්තා අන්තිමට පදිංචිව සිටි ප්‍රදේශයේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. එවැනි සෑම ඉල්ලීමක් සමගම එකී ඉල්ලුම්කරු විසින් 8ආ වගන්තිය ප්‍රකාරව දෙනු ලබන දිව්රුම් ප්‍රකාශයක් සමඟ අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තාට අදාළව පරීක්ෂණ කොමිෂන් සභාව හෝ විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව හෝ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අතුරු වාර්තාව හෝ වාර්තාව විසින් අනාවරණය කරගනු ලැබූ කරුණුවල සහතික පිටපතක් ද අමුණා තිබිය යුතු ය.

(2) දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙත (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් ලැබීමෙන් පසුව, මේ පනතේ ඉහතින්ම වූ විධිවිධානවලට පටහැනිව කුමක් සඳහන් වුව ද, අතුරුදහන් වූ තැනැත්තාගේ විස්තර නිශ්චිතව දක්වමින් දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් ස්වකීය අත්සන යටතේ වූ වාර්තාවක් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත යවනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වාර්තාව ලැබීමෙන් පසුව, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් එම වාර්තාවේ අන්තර්ගත කරුණු පිළිබඳ සැලකිල්ලට ගෙන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ ලේඛනයේ ලියාපදිංචි කරන ලෙස දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙත විධාන කරමින් නියෝගයක් නිකුත් කරනු ලැබ එම ඉල්ලීම ඉදිරිපත් කරන ලද අතුරුදහන් වූ තැනැත්තාගේ ඥාතියා වෙත 8ඉ වගන්තිය යටතේ දක්නට නොමැති බවට වූ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(4) දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් 8ඌ වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති යටතේ සපයා ඇති ආකාරයට පවත්වා ගෙන යනු ලබන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ වූ ලේඛනයේ එකී අදාළ විස්තර ඇතුළත් කළ යුතු ය.

(5) රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත යැවීම සඳහා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් නොපමාව අදාළ ලියාපදිංචි කිරීමේ අනුපිටපතක් (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද නියමය සමග ඉදිරිපත් කළ යුතු ය. රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් 8ඌ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පවත්වා ගෙන යනු ලබන ලේඛනයේ අවශ්‍ය සටහන් නොපමාව ඇතුළත් කළ යුතු ය. රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් කරන ලද ලියාපදිංචි සටහන් මේ පනතේ අරමුණු සඳහා අවසානාත්මක විය යුතු ය.

**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ ලේඛනය.**

8උ෧. (1) රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ ලේඛනයක් ඉලෙක්ට්‍රෝනිකව පවත්වාගෙන යා යුතු ය. ලියාපදිංචි කිරීමේ විස්තර අතුරුදහන් වූ තැනැත්තාගේ නම යන පදනමින් ඇතුළත් කරනු ලැබිය යුතු අතර, හැකිවිට අතුරුදහන් වූ තැනැත්තාගේ ජාතික හැඳුනුම්පතෙහි අංක යටතේ ඇතුළත් කළ යුතු ය.

(2) සෑම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයකු විසින් ම අතුරුදහන් වූ තැනැත්තන්ගේ ලේඛනයක් පවත්වා ගත යුතු අතර, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් නියමයක් මගින් නියම කරනු ලබන යම් සටහන් කළ යුතු ය.

(3) දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් කරන ලද සෑම ලියාපදිංචි කිරීමේ සටහනක් ම -

(අ) එම තොරතුරු රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලබා දුන් වේලාවේ පිළිවෙළ අනුව ඇතුළත් කරනු ලැබිය යුතු ය;

(ආ) අනුපිළිවෙළින් අංක යෙදිය යුතු අතර එම සටහන ඇතුළත් කරනු ලබන නිලධරයා විසින් ඊට අත්සන් තැබිය යුතු ය; සහ

(ඇ) පිටපත් තුනකින් යුක්තව පිළියෙල කරනු ලැබිය යුතු ය. පළමු පිටපත දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාගේ භාරයේ තිබිය යුතු අතර (මෙහි පහත "අනුපිටපත" යනුවෙන් සඳහන් කරනු ලබන) දෙවන පිටපත රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත යවනු ලැබිය යුතු අතර (මෙහි මින් මතු "දක්නට නොමැති බවට වූ සහතිකය" යනුවෙන් සඳහන් කරනු ලබන) තුන්වන පිටපත භාරදීම මගින් හෝ තැපෑල මගින් දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් සිය අත්සන ඇතුව කරන ලද පිටසනකින් ඒ සඳහා ඉල්ලීම කරන ලද ඥාතියා වෙත යැවීම කරනු ලැබිය යුතු ය.

වැරදි නිවැරදි කිරීම.

8එ. අත්හැරීමක් ඇතුළත්ව ලියාපදිංචි සටහනක යම් වැරැද්දක් නිවැරදි කිරීමට අදාළ (110 වන අධිකාරය වූ) උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ VI වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මෙම කොටස යටතේ කළ ලියාපදිංචි කිරීම්වලට ද අදාළ විය යුතු ය.

දක්නට නොමැති බවට වූ සහතිකය අදාළ වීම.

8ඒ. (1) දක්නට නොමැති බවට වූ සහතිකය එවැනි සහතිකයක් ඉල්ලුම් කළ අතුරුදහන් වූ තැනැත්තාගේ ඥාතියා විසින් -

(අ) යම් සමාජ සුබසාධන යෝජනා ක්‍රමයක් යටතේ ප්‍රතිලාභ සඳහා ඉල්ලුම් කිරීම;

(ආ) (i) දිසා අධිකරණයේ අධීක්ෂණය යටතේ තාවකාලිකව අතුරුදහන් වූ තැනැත්තාගේ දේපළ සහ වත්කම් පාලනය කිරීම සහ අතුරුදහන් වූ තැනැත්තාගේ යැපෙන දරුවන් වෙනුවෙන් තාවකාලික භාරකරුවකු සේ ක්‍රියාකිරීමට;

(ii) මෙහි (i) වන අයිතමය යටතේ කරන ලද ඉල්ලීමක් අදාළ දේපළ සම්බන්ධව හෝ යැපෙන දරුවන් වාසය කරන අධිකරණ බලය ඇති දිසා අධිකරණයේ සිදු කළ යුතු අතර, ලඝු කාර්ය පටිපාටිය යටතේ ඒ සම්බන්ධව පහත සඳහන් ආකාරයට ක්‍රියා කළ යුතු ය.

(අ) අතුරුදහන් වූ තැනැත්තාගේ දේපළ සහ අනෙකුත් වත්කම් කළමනාකරණයට අදාළ කරුණු සම්බන්ධව, දිසා අධිකරණයට ඉල්ලීමක් කළ දින සිට මාස හතරක් ඇතුළත අවසන් කළ යුතු ය;

(ආ) දෙමාපියන් දෙදෙනා ම දක්නට නොමැති විට හෝ ජීවත්වන දෙමාපියා දරුවාගේ යහපත රැකීමට අපොහොසත් වන විට, දරුවන්ගේ භාරකාරත්වය සම්බන්ධ කාරණා මාසයක් ඇතුළත අවසන් කළ යුතු ය.

(ඇ) අතුරුදහන් වූ තැනැත්තාගේ දේපළ වෙනුවෙන් විධායක, පරිපාලන සහ අධිකරණ අධිකාරීන් ඉදිරියේ කරුණු ඉදිරිපත් කිරීමට.

(2) අධිකාරි බලයක් ඇති සියලු ආයතන සහ තැනැත්තන් විසින් අතුරුදහන් වී ඇති තැනැත්තාගේ තත්ත්වය තහවුරු කිරීම සඳහා දක්නට නොමැති බවට වූ සහතිකය පිළිගෙන භාර ගත යුතු ය.

(3) (අ) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පැනනගින යම් ආරවුලක් ඥාතියා විසින් ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා වෙත යොමු කරනු ලැබිය හැකි ය.

(ආ) ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ආරවුල සම්බන්ධ කරුණු අදාළ ආයතන සමඟ සාකච්ඡා කිරීමෙන් පසු ඉල්ලීම ලැබී වැඩකරන දින දහයක් ඇතුළත තීරණයක් කළ යුතු ය.

(ඇ) ප්‍රාදේශීය ලේකම්වරයාගේ තීරණය ලිඛිත විය යුතු අතර ඒ සම්බන්ධව අවසානාත්මක ලෙස සැලකිය යුතු ය.

ක්‍රියාත්මක කාලසීමාව.

8ඔ. (1) දක්නට නොමැති බවට වූ සහතිකය එහි නිශ්චිතව සඳහන් දිනයේ සිට අවුරුදු දෙකක කාලයක් සඳහා වලංගුව පැවතිය යුතු යඃ

එසේ වුව ද-

(අ) අතුරුදහන් වූ තැනැත්තකුගේ ශරීරයේ ශේෂයන් සොයා ගනු ලැබුවහොත් හෝ අතුරුදහන් වූ තැනැත්තාගේ මරණය සම්බන්ධයෙන් වෙනත් තීරණාත්මක සාක්ෂි සොයාගනු ලැබුවහොත්, එවැනි අවස්ථාවක දක්නට නොමැති බවට වූ සහතිකය අවලංගු කරනු ලැබිය යුතු අතර, 6 වන වගන්තිය යටතේ මරණ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(ආ) දක්නට නොමැති තැනැත්තා ජීවත්ව සිටිතැයි සොයා ගනු ලැබුවහොත්, 13 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය. දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ අයුරින් ලියාපදිංචිය අහෝසි කිරීමට සහ දක්නට නොමැති බවට වූ සහතිකය අවලංගු කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතු ය.

(2) එකී අවුරුදු දෙකක කාලසීමාව අවසන් වීමෙන් පසුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් දක්නට නොමැති බවට වූ සහතිකයක් නිකුත් කර ඇති ඥාතියාගෙන් අතුරුදහන් වූ තැනැත්තාගේ තත්ත්වය පිළිබඳව විමසා සිටිය යුතු අතර, 1 වන වගන්තියේ (2)(අ) උපවගන්තියට යටත්ව, -

(i) 8අ වගන්තියේ (1)(ආ) උපවගන්තියට යටත්ව තවත් අවුරුදු දෙකක කාලයක් සඳහා දක්නට නොමැති බවට වූ සහතිකය පිටසන් කිරීම මගින් කාලසීමාව දීර්ඝ කළ හැකි ය; හෝ

(ii) මරණ සහතිකයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීමට ඥාතියා කැමැත්තෙන් සිටී නම්, 2 වන වගන්තිය යටතේ එම ඉල්ලීම ඉදිරිපත් කරන ලෙස එම තැනැත්තාට විධාන කර ලියාපදිංචිය අහෝසි කිරීමට පියවර ගෙන දක්නට නොමැති බවට වූ සහතිකය අවලංගු කළ යුතු ය; හෝ

(iii) ඥාතියා එකී සහතිකයේ කාලසීමාව දීර්ඝ කර ගැනීමට අපේක්ෂා කරනු නොලබන්නේ නම් දක්නට නොමැති බවට වූ සහතිකය අවලංගු කිරීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (3) වන උපවගන්තිය එහි "මෙහි උපලේඛනයේ දැක්වෙන", යන වචන වෙනුවට, "මෙහි උපලේඛනයේ අ ආකෘතියේ දැක්වෙන" යන වචන ආදේශ කිරීමෙන් සංශෝධනය කළ යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලැබේ:-

"සැක දුරු කිරීම.

14. සැක දුරු කිරීම සඳහා මෙසේ ප්‍රකාශ කරනු ලැබේ:-

(අ) 1 වන වගන්තියේ (2) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කාලසීමාව ඉකුත්වීම මත, 1 වන සහ 1අ වන කොටස්වල ක්‍රියාත්මකවීම අවසන් වී ඇත්නම් සහ 1 වන සහ 1අ වන කොටස්වල ක්‍රියාත්මක වන කාලසීමාව දීර්ඝ කිරීම සඳහා උපවගන්තිය යටතේ නියමයක් කර නොමැති නම්; සහ

(ආ) 1 වන සහ 1අ කොටස් ක්‍රියාත්මකව පවතින කාලසීමාව ඉකුත්වීමට පෙරාතුව 2 වන, 8 වන, 8අ වන, 10 වන සහ 11 වන වගන්තිවල විධිවිධාන ප්‍රකාරව පිළිවෙළින් මරණ සහතිකයක් හෝ දක්නට නොමැති බවට වූ සහතිකයක් නිකුත් කරවා ගැනීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර තිබේ නම්,

රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් මේ පනතේ 1 වන කොටසේ සහ 1අ වන කොටසේ විධිවිධාන ප්‍රකාරව එම තැනැත්තාගේ මරණය ලියාපදිංචි කිරීමට හෝ එම තැනැත්තා අතුරුදහන් වූ තැනැත්තකු ලෙස ලියාපදිංචි කිරීම පිළිබඳ කටයුතු සිදු කර පිළිවෙළින් මරණ සහතිකයක් හෝ දක්නට නොමැති බවට වූ සහතිකයක් නිකුත් කළ හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (ඈ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් ː-

"(ඇ) මේ පනත යටතේ කරන ලද ඉල්ලීමක් ක්‍රියාවෙහි යෙදවීම ප්‍රකාරව අතුරුදහන් වී ඇති බවට ලියාපදිංචි කර ඇති තැනැත්තකු ජීවත්ව සිටී නම්, එම තොරතුරු රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීම පැහැර හරින්නා වූ; හෝ

(ඉ) මේ පනත යටතේ නිකුත් කරන ලද දක්නට නොමැති බවට වූ සහතිකයක සඳහන් තැනැත්තා ජීවත්ව සිටින බව දැන දැනම හෝ එසේ විශ්වාස කිරීමට හේතු ඇතිව එම සහතිකය වංක ලෙස හෝ වංචනික ලෙස භාවිත කරන්නා වූ,";

(2) "අවුරුදු පහකට නොවැඩි වූ කාලයකට බන්ධනාගාරගත කිරීමෙන්" යන වචන වෙනුවට "රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමෙන්" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය "දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"අමාත්‍යවරයා" යන්නෙන්, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ; සහ

"ඥාතියා" යන්නෙන්, අතුරුදහන් වූ තැනැත්තකු සම්බන්ධයෙන් වන විට පහත සඳහන් තැනැත්තන් ඇතුළත් වේ ː-

(i) කලත්‍රයා;

(ii) දරුකමට හදාගත් ළමයින්, විවාහ නොවූ දෙමව්පියන්ගේ ළමයින් හෝ සුළු දරුවන් ඇතුළත්ව දරුවන්;

(iii) දෙමව්පියන් (සුළු මව, සුළු පියා, දරුකමට හදාගැනීමට ලබා ගත් තැනැත්තා);

(iv) පූර්ණ හෝ අර්ධ සහෝදරයන් හෝ සහෝදරියන් හෝ දරුකමට හදාගත් සහෝදරයන් හෝ සහෝදරියන්;

(v) මාමණ්ඩිය, නැන්දණිය, මස්සිනාවරුන්, නෑනාවරුන්, බෑණාවරුන්, ලේලිවරුන්;

(vi) මුණුපුරු, මිණිපිරියන් සහ සීයලා සහ ආච්චිලා.

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "උපලේඛනය" යන වචනයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:-

"අ ආකෘතිය"

(2) අ ආකෘතියට ඉක්බිතිව ම පහත දැක්වෙන ආකෘති ඇතුළත් කිරීමෙන්:-

"ආ ආකෘතිය

(8අ) (2) වගන්තිය)

**අතුරුදහන් වූ තැනැත්තකු ලියාපදිංචි කිරීම සඳහා සහ දක්නට නොමැති බවට වූ සහතිකයක් නිකුත් කිරීම සඳහා වූ ඉල්ලීම.**

1. අතුරුදහන් වූ තැනැත්තාගේ සම්පූර්ණ නම :-

2. ස්ත්‍රී/ පුරුෂභාවය සහ ජාතිය :-

3. උපන් දිනය :-

4. අවසන් වරට දුටු දිනය (ආසන්න වශයෙන්) :-

5. අවසන් වරට පදිංචිව සිටි නිවසේ ලිපිනය :-

6. ස්ථිර පදිංචි ලිපිනය :-

7. ඥාතියා ලෙස ඉල්ලුම් කරන තැනැත්තාගේ නම සහ පදිංචිය :-

8. අතුරුදහන් වූ තැනැත්තාට ඥාතියා ලෙස ඉල්ලුම්කරන තැනැත්තාගේ ඇති නෑකම :-

9. අතුරුදහන් වූ තැනැත්තාගේ සම්පූර්ණ නම් :-

පියා :-

මව :-

කලත්‍රයා :-

යැපෙන්නන් :-

ඉහත කී ........................................... (අතුරුදහන් වූ තැනැත්තාගේ නම) යන අය අවුරුද්දකට වැඩි කාලයක් දක්නට නොමැති බව ............................................ පදිංචි ............................. වන මම මෙයින් ප්‍රකාශ කරමි.

එම නිසා එකී තැනැත්තා ............................. (දක්නට නොමැති තැනැත්තාගේ නම) 2010 අංක 19 දරන මරණ සහ අතුරුදහන් වී ඇති තැනැත්තන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ අතුරුදහන් වූ තැනැත්තකු ලෙස ලියාපදිංචි කරන ලෙසත් එම තැනැත්තා සම්බන්ධයෙන් දක්නට නොමැති බවට වූ සහතිකයක් ඥාතියා වශයෙන් මා වෙත නිකුත් කරන ලෙසත් ඉල්ලා සිටිමි.

අතුරුදහන් වූ බවට වාර්තා කර ඇති තැනැත්තා ජීවත්ව සිටින බවට සොයා ගනු ලැබුවහොත් හෝ මරණයට පත් වී ඇති බවට සාක්ෂි ලැබුනහොත් මා විසින් ඒ බව රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත නොපමාව දැනුම් දෙමි.

දිනයඃ..............................

.............................................

ඉල්ලුම්කරුගේ අත්සන

ඇ ආකෘතිය

(8අ, 8ඉ සහ 8උෟ වගන්ති)

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

දක්නට නොමැති බවට වූ සහතිකය.

අංකයඃ දිස්ත්‍රික්කයඃ කොට්ඨාසයඃ

පහත සඳහන් තැනැත්තා, අභ්‍යන්තර කැළඹීම්වල හේතුවෙන් දක්නට නොමැති බවට වූ දැන්වීමක් .............................. පදිංචි .............................. යන අයගෙන් .............................. අද දින මා වෙත ලැබී ඇති අතර, ඒ අනුව පහත තොරතුරු ලියාපදිංචි කරන ලදී.

1. දක්නට නොමැති තැනැත්තාගේ සම්පූර්ණ නම :-
2. අවසන්වරට දුටු දිනය හා ස්ථානය :-
3. ස්ත්‍රී/ පුරුෂභාවය :-
4. ජාතිය :-
5. ජීවත් ව සිටී නම්, වයස :-
6. රැකියාව හෝ තත්ත්වය :-
7. දක්නට නොමැති තැනැත්තාගේ සම්පූර්ණ නම් -

    පියා :-

    මව :-

කලත්‍රයා ෑ-

යැපෙන්නන් ෑ-

මෙම සහතිකය ........................... දින සිට .............................. දක්වා අවුරුදු දෙකක කාලයක් සඳහා වලංගු වේ.

දිනය - ..............................

..............................

රෙජිස්ට්‍රාර්

අතුරුදහන් වූ තැනැත්තාගේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා පත් කරන ලද ඥාතියා.

..........................................පදිංචි ...........................................................
(නම)............................. (ජා.හැ.අංකය)..................................................
(සම්බන්ධය) ලෙස.

ඥාතියාගේ අත්සන

*සැ.යු.*- 2010 අංක 19 දරන මරණ සහ අතුරුදහන් වී ඇති තැනැත්තන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8ඒ (2) වගන්තිය ප්‍රකාරව සෑම බලයේ සිටින ආයතනයන් සහ තැනැත්තන් ම සමාජ සුභසාධන වැඩපිළිවෙළ යටතේ ප්‍රතිලාභ ඉල්ලුම් කිරීමේ දී අතුරුදහන් වූ තැනැත්තා සහ ඔහුගේ දේපළ වෙනුවෙන් විධායක, පරිපාලන සහ අධිකරණ අධිකාරීන් වෙත නියෝජනයක් කිරීමේ දී දක්නට නොමැති බවට වූ සහතිකය, අතුරුදහන් වූ තැනැත්තාගේ තත්ත්වය පිළිබඳ සාක්ෂියක් වශයෙන් පිළිගැනීම සහ භාරගැනීම සිදු කළ යුතු බවට අවශ්‍ය කෙරේ.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**16.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.